# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1992 අංක 44 දරන
# මෝටර් වාහන (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1992 සැප්තැම්බර් මස 04 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය

මිල : ශත 75 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි.

1992 අංක 44 දරන මෝටර් වාහන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1992 අගෝස්තු මස 31 වන දින]

එල්. ඩී.—ඕ. 27/91

මෝටර් වාහන පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

මහා මාර්ගය පාවිච්චි කරන්නන්ගේ ආරක්ෂාව සඳහා රියැදුරු ප්‍රවීණතාව සහ වාහන යෝග්‍යතාව සම්බන්ධයෙන් අවම ප්‍රමිති නියම කිරීම අවශ්‍ය වී ඇති හෙයින් :— පූර්විකාව.

(අ) යම් මහා මාර්ගයක පාවිච්චි කිරීමට අවසර දෙන ලද සෑම වාහනයක් ම ;

සහ

(ආ) යම් මහා මාර්ගයක එවැනි යම් වාහනයක් පැදවීමට හෝ එවැනි වාහනයක් පාලනය කරගෙන යාමට අවසර දෙනු ලැබූ සෑම තැනැත්තකුම,

තත් කාර්යය සඳහා නීතියෙන් නියම කරනු ලබන අවම ප්‍රවීණතාවට හෝ අවම යෝග්‍යතාවට අනුකූල වන බව නිසැක කරනු පිණිස වාහන යෝග්‍යතාව සහ රියැදුරු ප්‍රවීණතාව සම්බන්ධයෙන් අවම ප්‍රමිතියක් නියම කිරීම ශ්‍රී ලංකා ආණ්ඩුවේ ප්‍රතිපත්තිය වන හෙයින් ;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1992 අංක 44 දරන මෝටර් වාහන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 203 වන අධිකාරය වූ මෝටර් වාහන පනතේ 124 වන වගන්තියට ඉක්බිති ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය එම පනතේ 124අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතුය. 203 වන අධිකාරයෙහි 124අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"රියදුරු බලපත්‍ර අරමුදල.

124අ. (1) මේ පනතේ කාර්ය සඳහා (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "රියදුරු බලපත්‍ර අරමුදල" යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් කලින් කල තීරණය කරනු ලබන පරිදි රියදුරු බලපත්‍ර කාඩ්පත් නිකුත් කිරීමේ පිරිවැය වශයෙන් 124 වන, 126 අ වන, 128 වන හෝ 231 වන වගන්ති යටතේ අයකරනු ලබන නියමිත ගාස්තුවෙන් යම් කොටසක් එකී අරමුදලට ගෙවිය යුතු ය.

(3) රියදුරු බලපත්‍ර කාඩ්පත් නිකුත් කිරීම සම්බන්ධයෙන් ගෙවීමට නියම කරනු ලබන සියලු මුදල් ප්‍රමාණයන් එම අරමුදලින් ගෙවිය යුතු ය.

(4) අරමුදලෙහි ශේෂ වන යම් අතිරික්තයක් වේ නම් එය, මාර්ග ආරක්ෂාව සහ අනතුරු වැළැක්වීම ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාව කෙරෙහි සැලකිල්ල ඇතිව, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් කාර්ය සඳහා ප්‍රයෝජනයට ගනු ලැබිය හැකි ය.

2—ඩී 0226826,230 (92/05)

(5) අරමුදලේ පාලනය පිළිබඳව කොමසාරිස් වරයා වගකිව යුතු ය.

(6) අරමුදලෙහි ගිණුම්, විගණකාධිපතිවරයා විසින් විගණනය කළ යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තිය සංශෝධනය කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 125 වන වගන්තියේ (1) වන උප වගන්තිය වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) සෑම රියැදුරු බලපත්‍රයක් ම නියමිත ආකෘතිය අනුව විය යුතු ය. රියැදුරු බලපත්‍රයක්, කාඩ්පතක ආකාරයෙන් නිකුත් කරනු ලැබ ඇති අවස්ථාවක, නියම කරනු ලබන විස්තරයකින් වූ පිටසන් ආකෘතියක් එම බලපත්‍රය සමග තිබිය යුතු ය. බල පත්‍රය සමග ඇත්තා වූ එම පිටසන් ආකෘතිය මේ පනතේ කාර්ය සඳහා බලපත්‍රයේ කොටසක් වශයෙන් සංයුක්ත විය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියේ "(2) වන හා (3) වන උපවගන්තිවල" යන යෙදුම වෙනුවට "(2) වන සහ (3) වන උපවගන්තිවල සහ 126අ වගන්තියේ" යන යෙදුම ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 126 අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 126 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 126අ වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු ය.

"රියැදුරු බලපත්‍රය ප්‍රතිස්ථාපනය කිරීම.

126අ. (1) මේ පනතෙහි පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනත යටතේ නිකුත් කරනු ලැබූ හෝ, නිකුත් කරනු ලැබුවේ යයි සලකනු ලබන්නා වූ ද අදාළ නියමයෙහි නිශ්චිතව සඳහන් අනුක්‍රමික අංකයක් දරන්නා වූ ද සෑම රියැදුරු බලපත්‍රයක්ම වෙනුවට නියමිත ආකෘතිය අනුව කාඩ් පතක ආකාරයෙන් වූ රියැදුරු බලපත්‍රයක් ලබාදිය යුතු බව ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කළ හැකි ය. තවද ඒ බලපත්‍රය නිශ්චිත කාලසීමාවක් සඳහා හෝ දරන්නාගේ ජීවිත කාලය සඳහා හෝ නිකුත් කරනු ලැබ ඇතද, එසේ නිකුත් කරන ලද බලපත්‍රය අවලංගු කිරීම සඳහා සුදුසු යයි ඔහු විසින් සලකනු ලබන යම් දිනයක් නියම කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබ ඇති අවස්ථාවක, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් අනුක්‍රමික අංකයක් දරන පියැදුරු බලපත්‍රයක් දරන සෑම තැනැත්තකු විසින්, ඒ බලපත්‍රය වෙනුවට නියමිත ආකෘතිය අනුව කාඩ්පතක ආකාරයෙන් වූ පියැදුරු බලපත්‍රයක් සඳහා වූ ඉල්ලීමක් ඒ බලපත්‍රය අවලංගු කිරීම සඳහා නියම කරන ලද දින හෝ ඊට පෙර කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක්ම සමඟ—

(අ) පියැදුරු බලපත්‍රය ප්‍රතියෝජනය කිරීම සම්බන්ධයෙන් නියමිත ගාස්තුව ;

(ආ) නියම කරනු ලබන ප්‍රමාණයකින් වූ සහ ඉල්ලීමේ දිනයට පෙර මාස හයකට කලින් නොවන දිනයක දී ගනු ලැබූ ඉල්ලුම්කරුගේ ඡායාරූප පිටපත් දෙකක් ; සහ

(ඇ) පියැදුරු බලපත්‍ර කාඩ්පතක් ලබා ගැනීමට අපේක්ෂා කරන්නේ යම් පියැදුරු බලපත්‍රයක් වෙනුවට ද ඒ පියැදුරු බලපත්‍රය,

ඉදිරිපත් කළ යුතු ය.

(4) පියැදුරු බලපත්‍රයක් ප්‍රතියෝජනය කිරීම පිණිස මේ වගන්තිය යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ ඒ ඉල්ලීම ඉදිරිපත් කරන සෑම තැනැත්තකුටම නියමිත ආකෘතියෙහි වූ තාවකාලික පියැදුරු බලපත්‍රයක් කොමසාරිස්වරයා විසින් නිකුත් කළ යුතු ය. මේ වගන්තිය යටතේ ඒ තැනැත්තාට කාඩ්පතක ආකාරයෙන් වූ පියැදුරු බලපත්‍රයක් නිකුත් කරනු ලබනතුරු එම තාවකාලික පියැදුරු බලපත්‍රය වලංගු වන්නේ ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තියේ, (1) වන උපවගන්තියේ අගට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:— ප්‍රධාන ප්‍රඥප්තියේ 128 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුවද, පියැදුරු බලපත්‍රයක වලංගු භාවය වෙනත් යම් මෝටර් වාහන පංතියකට හෝ පංතිවලට දීර්ඝ කිරීම, ඒ පංතියේ හෝ පංතිවල මෝටර් වාහන කාඩ් පතක ආකාරයෙන් වූ අලුත් පියැදුරු බලපත්‍රයක් නිකුත් කිරීමෙන් කළ යුතු ය.".

8—ඩී 022682 (92/05)

ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය සංශෝධනය කිරීම.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 129 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (1) වන උප වගන්තියේ "මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් සඳහා වූ කිසිදු රියැදුරු බලපත්‍රයක් වලංගු නොවිය යුතුය." යන වචන වෙනුවට "මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් සඳහා වූ කිසිදු රියැදුරු බලපත්‍රයක් වලංගු නොවිය යුතු ය. තව ද රියැදුරු බලපත්‍රය කාඩ් පතක ආකාරයෙන් නිකුත් කර ඇති විටදී, එකී බලපත්‍රය ප්‍රකාශිතව නිකුත් කර ඇත්තේ යම් මෝටර් කෝච් රථයක්, ලොරියක් හෝ මෝටර් ට්‍රයිසිකල් වැන් රථයක් සඳහා වලංගු වන පරිදි ද, අවස්ථාවෝචිත පරිදි, එකී ප්‍රකාශිතව සඳහන් මෝටර් රථයක් සඳහා පමණක් එකී රියැදුරු බලපත්‍රය වලංගු විය යුතුය." යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ වගන්තියේ (2) වන උපවගන්තියෙහි "වලංගු වනු ලබන බවට ප්‍රකාශ නොකළ යුතු ය." යන වචන වෙනුවට "වලංගු වනු ලබන බවට ප්‍රකාශ කිරීම හෝ නිකුත් කිරීම නොකළ යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එකී වගන්තියේ (3) වන උප වගන්තියෙහි—

(i) එහි (අ) ඡේදයෙහි "වලංගු බවට ප්‍රකාශ කිරීම" යන වචන වෙනුවට "අවස්ථාවෝචිත පරිදි වලංගු වනු ලබන බවට ප්‍රකාශ කිරීම හෝ නිකුත් කිරීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ උපවගන්තියේ (ආ) ඡේදය වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ආ) (1) වන උපවගන්තිය යටතේ කරන ලද සටහනින් මෝටර් කෝච් රථ, ලොරි හෝ වලංගු වනු ලබන බවට ප්‍රකාශ කරනු ලැබ ඇත්තා වූ හෝ නිකුත් කරනු ලැබ ඇත්තා වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ බල පත්‍රය හෝ සටහන අවලංගු කරනු ලැබිය යුතු බවට හෝ අත්හිටුවනු ලැබිය යුතු බවට කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි අතර, ඒ අනුව ඒ බලපත්‍රය හෝ සටහන කොමසාරිස්වරයා විසින් අවලංගු කිරීම හෝ අත්හිටුවීම කරනු ලැබිය හැකි ය." ;

(ඇ) ඒ වගන්තියේ (6) වන උපවගන්තියෙහි "බලපත්‍රයක කරනු ලැබූ යම් සටහනක්" සහ "කොමසාරිස්වරයා විසින් එම වගන්තියේ" යන වචන වෙනුවට පිළිවෙලින් "බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ හෝ එහි යම් සටහනක්" සහ "කොමසාරිස්වරයා විසින් අලුත් බලපත්‍රයක් නිකුත් කළ හැකිය ; නැතහොත් එම වගන්තියේ" යන වචන ආදේශ කිරීමෙන්.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වගන්තියේ (1) වන උපවගන්තිය අගට පහත දක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 133අ වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද, කාඩ්පතක ආකාරයෙන් වූ රියැදුරු බලපත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සටහන, 125 වන වගන්තිය යටතේ නියමිත පිටසන් ආකෘතිය මත යෙදිය හැකි අතර, එසේ යොදනු ලැබූ සටහනක් මේ පනතේ කාර්ය සඳහා එම රියැදුරු බලපත්‍රය මත යොදන ලද්දක් වශයෙන් සැලකිය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ (5) වන උපවගන්තිය අගට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුවද, කාඩ්පතක ආකාරයෙන් වූ රියැදුරු බලපත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ පිටසන, 125 වන වගන්තිය යටතේ නියමිත පිටසන් ආකෘතිය මත යෙදිය හැකි අතර එසේ යොදනු ලැබූ පිටසනක් මේ පනතේ කාර්ය සඳහා එම රියැදුරු බලපත්‍රය මත යොදන ලද්දක් වශයෙන් සැලකිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 231 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අගට පහත දැක්වෙන අතුරු වගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 231 වන වගන්තිය සංශෝධනය කිරීම.

"එසේ වුව ද, කාඩ්පතක ආකාරයෙන් වූ යම් රියැදුරු බලපත්‍රයක අනුපිටපත් සම්බන්ධයෙන් වන විට කොමසාරිස්වරයා විසින් ඒ පිටසන හෝ සටහන්, 125 වන වගන්තිය යටතේ නියමිත පිටසන් ආකෘතිය මත යොදනු ලැබිය හැකි ය.".

ඇතැම් බලපත්‍ර වලංගුව පවතින බව.

**11.** (1) මෝටර් වාහන පනතේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇතද,—

(අ) 1989 මැයි මස 1 වන දින හෝ ඉන් පසුව සහ 1990 අප්‍රේල් මස 4 වන දිනට පෙර මෝටර් වාහන පනතේ 125 වන වගන්තිය යටතේ රියැදුරු බලපත්‍රයක් වෙනුවට නිකුත් කරනු ලැබුවා වූ කාඩ්පතක ආකාරයෙන් වූ සෑම රියැදුරු බලපත්‍රයක්ම ; සහ

(ආ) 1989 මැයි මස 1 වන දින හෝ ඉන් පසුව සහ 1990 ජූලි මස 13 වන දිනට පෙර මෝටර් වාහන පනතේ 125 වන වගන්තිය යටතේ රියැදුරු බලපත්‍රයක් වෙනුවට නිකුත් කරනු ලැබුවා වූ කාඩ්පතක ආකාරයෙන් වූ සෑම රියැදුරු බලපත්‍රයක්ම

ඒ බලපත්‍රය නිසි ආකෘතිය අනුව නිකුත් කරනු ලැබ නොමැති වීමේ හෝ ඒ බලපත්‍රය වෙනුවට වෙනත් බලපත්‍රයක් ලබාදීමට බලය පැවරෙන ලිඛිත නීතියක් නොමැතිවීමේ හේතුව නිසාම අවලංගු වූයේ යයි හෝ අවලංගු වූ ලෙස සලකනු නොලැබිය යුතු අතර, මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූ හෝ ප්‍රතියෝජනය කරනු ලැබූ රියැදුරු බලපත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) (1) උපවගන්තියෙහි සඳහන් එවැනි සෑම බලපත්‍රයක්ම නිකුත් කිරීම සම්බන්ධයෙන්, කොමසාරිස්වරයා විසින් අය කර ගනු ලබන සියළු ගාස්තු, මෝටර් වාහන පනතේ විධිවිධාන යටතේ අය කරගනු ලැබූ ලෙසද, වලංගු ලෙස අය කරගනු ලැබූ ලෙස ද සැලකිය යුතු ය.

(3) මේ පනත ආරම්භ වන දිනට පෙර මෝටර් වාහන පනත යටතේ කාඩ්පතක ආකාරයෙන් නිකුත් කරන ලද සෑම රියැදුරු බලපත්‍රයක් දරන්නකුටම පිටපත් ආකෘතියක් නිකුත් කරනු ලැබ නොමැති නම්, මෝටර් වාහන පනතේ 125 වන වගන්තිය යටතේ නියමිත පිටපත් ආකෘතියක් ඔහු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු බව.

**12.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.